# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 1735/ 2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திகதி / Date — 21/11/2024 පැය 0710

## මාධ්‍ය නිවේදනය

**වෙඩි තබා මනුෂ්‍ය ඝාතනයක් - දික්වැල්ල පොලිස් වසම.**

2024.11.21 වන අද දින අළුයම් කාලයේ දික්වැල්ල පොලිස් වසමේ වලස්ගල දොරමුරේ පාර පශු වෛද්‍ය කාර්යාලය ආසන්නයේදී යතුරු පැදියකින් ගමන් කරමින් සිටි පුද්ගලයෙකුට වෙඩි තබා ඝාතනය කර ඇති බවට දික්වැල්ල පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 48 ක් වූ වලස්ගල ප්‍රදේශයේ පදිංචි රියදුරු රැකියාවේ නිරතව සිටි පුද්ගලයෙකි.**

වෙඩි තැබීම සඳහා සැකකරුවන් පැමිණි ආකාරය සම්බන්ධයෙන් මෙතෙක් තොරතුරු අනාවරණය වී නොමැත. සැඟව සිටින සංවිධානාත්මක අපරාධකරුවෙකුගේ නමින් ප්‍රදේශයේ පුද්ගලයෙකුගෙන් කප්පම් මුදල් ලබා ගැනීමක් සම්බන්ධයෙන් මරණකරුට එරෙහිව ගරු අධිකරණයේ නඩුවක් විභාග වන බැවින්, මෙම වෙඩි තැබීම හා අදාල කප්පම් ගැනීමේ සිද්ධිය අතර යම් සම්බන්ධතාවයක් පවතීද යන්න විමර්ශන නිලධාරීන්ගේ අවධානයට යොමු වී ඇත. වෙඩි තැබීම සඳහා ටී 56 වර්ගයේ ගිනි අවියක් භාවිතා කර ඇති බවට පොලිසිය සැකකරනු ලබයි. සැකකරුවන් අත්අඩංගුවට ගැනීම සඳහා දික්වැල්ල පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**